නොදුන්න ද මට එහි ඇති වෙනසක් නැත. ඊටත් පසු සතියේ අඟහරුවාදා මට පර්ත් යාමට ආසනයක් වෙන්කර ගත හැකි විය. ඒ සතියේ සඳුදා උදේම මම විශ්වවිද්‍යාලයේ මා සිටි අධ්‍යාපන පීඨයට කතාකොට සමාර්ව ඉල්ලා ගතිමි. මට දින කිහිපයකට නැවතීමට තැනක් අවශ්‍ය බව ඔහුට දන්වා ඔහු සිටින තැන ලිපිනය ඉල්ලා ගතිමි.

මා පර්ත් පැමිණියේ අඟහරුවාදා දවල් දෙකටය. සමර්ව දැකීමට බලාපොරොත්තු නොවුව ද ඔහු මා කැඳවාගෙන යාමට පැමිණ සිටියේ ඇඩම් ද සමඟය. සමාර්ගේ නවාතැනට මා හැරලූ ඔවුන් නැවත විශ්වවිද්‍යාලයට පිටත්ව ගියේය. ඔවුනට කරදර කිරීම මගේ බලාපොරොත්තුව නොවුණ ද මේ නවාතැන් සොයමින් මට ගතකළ හැකි අවස්ථාවක් නොවුණි.

එමින් ගමන්ම මම කුළී රථයක් සතියකට වෙන්කරවා ගතිමි. මගේ බලාපොරොත්තුව වූයේ හැකිතාක් ඉක්මනින් ටාන්‍යාව මුණගැසීමයි. මේ කරුණ අනෙකුගෙන් ඇය දැනගැනීමට පෙර මා ඇයව මුණගැසිය යුතු බව ගෙදර දී ම තීරණය කරගෙන තිබුණකි. කලින්දා රාත්‍රිය නිදි වර්ජිතව සිටි බැවින් මට දැනුනේ අධික තෙහෙට්ටුවකි. හරිහැටි ආහාරයක් ද නොගත්තෙන් තෙහෙට්ටුව වැඩියෙන් දැනෙයි. එහෙත් මට නිදිමතක් හෝ බඩගින්නක් හෝ දැනුනේ නැත. පිසසෙක් ලෙසට ටාන්‍යගේ ගෙදරට යාමට මගේ අදහසක් නොවිනි. නාගෙන ඇඳුම් මාරුකර ගත් මම සමාර්ට පණිවිඩයක් ලියා තබා පිටත් වීමි.

මා මේ දැන් ගතකරමින් සිටින සෑම විනාඩියක් ම හදවතින් මදින් මද සිතමින් ගොනු කරගත් කුඩා කාල පරිච්ඡේදයන් ය. මුලින් වතාවේ පැමිණියාට වඩා වෙනස් අරමුණකින් යුතුව අද මම පර්ත් පැමිණ සිටිමි. ටාන්‍යාට මම ආදරය කරන බව සැබෑ ය. නමුත් ඈ දිනා ගැනීමේ අරමුණක් අද මා තුළ මතුව එන්නේ නැත. ඈ පත් වී ඇති දුකේ දී ඇයට පිහිටවීම මා තුළ ඈ වෙනුවෙන් වන ආදරයේ නාමයෙන් කළ යුතු යුතුකමක් ලෙසට මම අද දකිමි.

වාහනය ටාන්‍යාගේ නිවසට හරවන විට මා තුළ ඇත්තෙන් ම තැති ගැන්මක් ඇති විය. ඉදිරිපසින් තාප්ප සහ ගේට්ටු බොහොමයක් නිවෙස්වල මෙහි දී දකින්නට නොලැබෙන බැවින් ගෙදර දොරටුව දක්වා බාධාවකින් තොරව යාමට මට අවස්ථාව ලැබිණි. දොරටුව විවර කරන ලද්දේ ටාන්‍යගේ පියා ය. ඔහු මා හඳුනන්නේ නැති කෙනෙකුන් ලෙස ප්‍රශ්නාර්ථයෙන් බලා සිටීම ගැන මම පුදුම වුණෙමි.

-හලෝ... මම ලහිරු... ටාන්‍යගේ යාළුවෙක්... මට ටිකකට ටාන්‍යව මුණගැහෙන්න පුළුවන් ද?" මගේ කට හඬ ඇසී ඇගේ මව ඉදිරියට පැමිණියේ ඒ මොහොතේ ය.

-ලහිරු එන්න ඇතුළට. වාඩිවෙන්න..." ඇය කතාකලේද මා කෙරෙහි කිසිම විශේෂත්වයක් නොපෙන්වමිනි. සිතාගෙන ආවාට වඩා යම් වෙනසක් මෙහි තිබෙන බව මට තේරුම් ගියේය. මම වැඩිදුරට සිත සිතා නොසිටියෙමි. මා මේ පැමිණ සිටින්නේ අනිත් කිසි ම වෙනස්කමක් සැලකිල්ලට ගැනීමට නොවේ.

-මට ඕනෑ ටාන්‍යව මුණගැහෙන්නයි..."

මම කෙලින් ම ඇගේ මව දෙස බලමින් පැවසුවෙමි. ඇය මට පිළිතුරක් නොදී ටාන්‍යාගේ පියා දෙස මෙහොතෙකට බලනවා මම දිටිමි. තැතිගැන්මක් සිතේ ඇතිවිය. දෙපතුලින් මතු වී ශරීරය පුරා

-මට ඕනෑ ටාන්‍යව මුණගැහෙන්නයි..."

මම කෙලින් ම ඇගේ මව දෙස බලමින් පැවසුවෙමි. ඇය මට පිළිතුරක් නොදී ටාන්‍යාගේ පියා දෙස මෙහොතෙකට බලනවා මම දිටිමි. තැතිගැන්මක් සිතේ ඇතිවිය. දෙපතුලින් මතු වී ශරීරය පුරා දිවයන හිරි වැටීමට මුළුමනින් ම නතුවීමට පෙර මම නැවත වරක් කතා කළෙමි.

-ඇයි ටාන්‍ය ගෙදර නැද්ද?"

ටාන්‍යාගේ පියා මා ඉදිරිපිටට පැමිණ සිටගත්තේය. වාඩිවී සිටින්නේ මා පමණක් ය. මා තුළ වූ දුර්වල ශරීර තත්වය නිසා ම දිගටම එසේ වාඩිවී සිටිමි. එහෙත් කුමන හෝ දෙයක් ඉක්මනින්ම දැනගත යුතුයැයි යන හැඟීමෙන් පෙළෙනු ලැබූ මම දිගටම කතාකලෙමි.

-ටාන්‍ය කොහේ ද?... ඉන්න තැන කියන්න පුළුවන් නම්... මම හම්බ වෙන්නම් ගිහින්..." ඈ අත ජංගම දුරකථනයක් තිබුණා මට මතක නැත. ඒ නිසා ඒ ගැන විමසීමෙන් ඵලක් නොමැත.

-නැත්නම් එයා එන වෙලාව කියන්න මම එන්නම් ඒ වෙලාවට..." මම නොනවත්වා ම කතා කළෙමි.

ඇගේ පියා පළමුවරට මට කතා කළේ ය. -ලහිරුට ගිහිල්ල හම්බ වෙන්න පුළුවන් තැනක ටාන්‍ය දැන් නැහැ... එයා ආපහු ගෙදර එයි කියල බලාපෙරොත්තු වෙන්නත් බැහැ..."

ඔහුගේ මුහුණ හැඟීම් විරහිතය,

දිවයන හිරි වැටීමට මුළුමනින් ම නතුවීමට පෙර මම නැවත වරක් කතා කළෙමි.

-ඇයි ටාන්‍ය ගෙදර නැද්ද?"

ටාන්‍යාගේ පියා මා ඉදිරිපිටට පැමිණ සිටගත්තේය. වාඩිවී සිටින්නේ මා පමණක් ය. මා තුළ වූ දුර්වල ශරීර තත්වය නිසා ම දිගටම එසේ වාඩිවී සිටිමි. එහෙත් කුමන හෝ දෙයක් ඉක්මනින්ම දැනගත යුතුයැයි යන හැඟීමෙන් පෙළෙනු ලැබූ මම දිගටම කතාකලෙමි.

-ටාන්‍ය කොහේ ද?... ඉන්න තැන කියන්න පුළුවන් නම්... මම හම්බ වෙන්නම් ගිහින්..." ඈ අත ජංගම දුරකථනයක් තිබුණා මට මතක නැත. ඒ නිසා ඒ ගැන විමසීමෙන් ඵලක් නොමැත.

-නැත්නම් එයා එන වෙලාව කියන්න මම එන්නම් ඒ වෙලාවට..." මම නොනවත්වා ම කතා කළෙමි.

ඇගේ පියා පළමුවරට මට කතා කළේ ය. -ලහිරුට ගිහිල්ල හම්බ වෙන්න පුළුවන් තැනක ටාන්‍ය දැන් නැහැ... එයා ආපහු ගෙදර එයි කියල බලාපෙරොත්තු වෙන්නත් බැහැ..."

ඔහුගේ මුහුණ හැඟීම් විරහිතය, සෝකාකූලය,....? හදවතට කිහිසි පහරක් වැදුනාක් මෙන් වූ ඒ වචන ටික මුළු ශරීරය පුරා ම වේදනා දෙමින් පැතිරගියේ විදුලි සැරයක වේගයෙනි. මම නැගී සිටියෙමි. ඇගේ පියාගේ හැඟීම් විරහිත සෝකාකූල මුහුණ දෙස නැවත වරක් නොබලා මම නැගී සිටියෙමි.

මට ඒ නිවස තුළ දී යමක් සිදුවෙතැයි ඇතිවූ හැඟීමට බියෙන් මොහොතකදු ප්‍රමාදයකින් තොරව පැමිණ මම වාහනයට ගොඩවූයෙමි. රථය පණ ගන්වා ගත්ත ද මුළු ගතම අප්‍රාණික බවක් දක්වයි. මම මහ පාරට වාහනය ඇතුළුකලේ පැහැදිලි සිහියකින් නොවුනි. වේගයෙන් ඇසුණු හෝන් හඬ මට විය හැක. එහෙත් එය කොයි දෙසින් පැමිණි හඬක් දැයි නොදුටුවෙමි. මට තවත් ඉදිරියට යාමට නොහැක යැයි දැනුන නමුත් සිහි එලවාගෙන ඒ නිවස පසුකළෙමි. පාර අනිත් පැත්තට වාහනය හරවා ගෙන යන්තමින් අයින් කර එය නවතා දැමුවෙමි. මා රථයෙන් පිටතට ආවේ පපුව දෙසින් දැනුන දැඩි වේදනාවක් ද සමඟ ය. වාඩි වීමට තැත් කළේ කලන්ත ගතියක් දැනුන බැවිනි. එහෙත් එසේ වාඩි වීමට අවස්ථාවක් මා ලැබුවේ නැත.....

විස්තර කිරීමට නොහැකි වේදනාවකින් මගේ මුළු ශරීරය ම ඇදුම් කන බවක් මට හැඟී යන්නට විය. දෑස් හැර බැලීමට මට උවමනා කළ ද ඊයම්බරු එල්ලුවාක් මෙන් දෑස ඇර ගැනීමට නොහැකි බවක් දැනෙන්නට විය.

-අම්මා..." ඒ හඬ මගේ මනස කරා කොහේදෝ සිට පැමිණියාක් මිස මා වෙතින් නිකුත්වූ හඬක් නොවි යැයි මම සිතමි.

එහෙත් ඒ සමඟම මගේ සුරතට අම්මාගේ ස්පර්ශය දැනෙන්නට විය. ඒ ස්පර්ශයත් සමඟ ම ක්ෂණික ශක්තියක් මම ලැබුවෙමි. මම දෑස් හැර අම්මා දෙස බැලුවෙමි. නමුත් මා අසල මගේ අත අල්ලාගෙන සිටින්නේ මගේ අම්මා නොව, ටාන්‍යාගේ අම්මා ය.

-කෝ... ටාන්‍යා...?"

මම ඇගෙන් ඇසුවෙමි. නමුත් ඒ වචන මට පිටකර ගත නොහැකි විය. කට ඇරීමට ගත් මුල් උත්සාහයේ දීම මා හිස ඉතා තදින් ඇඳුම් දෙන බව මට දැනෙන්නට විය. මම අත ඔසවා එය මගේ හිස වෙතට ගෙන යන්නට තැත් කළෙමි. එහෙත් පිටි අත්ල මත ගසා තිබෙන කටුව මා දුටුවේ එවිට ය. රෝහලේ ඇඳක් මත මා සතපවා සිටින බව අවබෝධ කරගැනීමට මීටත් වඩා කරුණු මට අවශ්‍ය නොවීය. මම නැවත දෑස පියා ගතිමි. සිදුවී තිබෙන්නේ කුමක්ද යන්න පිළිබඳ දැනීමක් මා වෙත නොතිබුනද එක කරුණක්,... අප්‍රමාණ වේදනාවක් හදවතට ඇතුළු කරවන කරුණක් පිළිබඳ මතකයක් මා වෙත තිබේ.... මනස ඉදිරිපිට පෙළගැසෙන අඳුරු මතකයන් ගොන්නෙන් පැණයාමට මට ඇත්නම්..... මා දෙනෙතින් කඳුළු කඩා හැලේ..... මගේ ශාරීරික වේදනාව අභිබවා ටාන්‍යා වෙනුවෙන් ඇතිවුණු අප්‍රමාණ වේදනාවකින් මගේ හදවත පිරී යන්නට විය. ඇගේ ජීවිතයට යමක් සිදුවී ඇත්දැයි හදවත හඬා වැටේ....

මම යාන්තමට හෝ ඇස් ඇර බලන බොහෝ අවස්ථා වලදී ටාන්‍යාගේ මව මා අසල නිරතුරුව ම රැඳී සිටීමත්, කාරුණිකව මා අස්වැසීමට තැත් කිරීමත් මට මහත් දුකක් ඇතිකර දුන් කාරණයකි.

සම්පූර්ණ දවසකට පසු නිර්වින්දන බෙහෙත් නිසා මා තුළ ඇතිවී තිබූ මත් ගතියෙන් මම මිදී සිටියෙමි.

-ලහිරු... මම කතා කරන දේ අහන් ඉන්න. ඔයා උත්තර දෙන්න මහන්සිවෙන්න එපා... මම අහන ප්‍රශ්නයට ඔයා කැමැති නම් විතරක් ඇස් දෙක අරින්න... කැමැති නැත්නම් ඇස් දෙක වහන්න. එතකොට මම තේරුම් ගන්නව...ඉස්සෙල්ලා ම කියන්න ඔයාගෙ දෙමාපියන්ට මේ ගැන කියනවට ඔයා කැමැති ද...?"

මම දෑස් පියා ගතිමි. ඔවුන්ට වේදනා දීම කළ නොහැක.

-හොඳයි ඔයාට කියන්න අවශ්‍ය යාළුවෙක් ඉන්නව ද?"

මට මේ ඇස් අරින වහන සෙල්ලම කළ නොහැක. මම ඇයට සංඥා කර මට ලිවීමට යමක් ඉල්ලා සිටියෙමි. සමාර්ගේ නමත් විශ්වවිද්‍යාලයේ අංකයත් ඇයට ලියා දුන්නේ ඔහුට දැන්වීම මගේ යුතුකමක් බැවිනි. ඇය එවලේ ම මගේ ඇඳ අසල තිබූ දුරකථනය ක්‍රියාත්මක කර සමාර්ට කතා කළේ ය. ඇය විසින් ඔහුට කරනලද විස්තර කිරීමෙන් මට සිදුව ඇත්තේ කුමක් ද යන්න මම අවබෝධ කර ගතිමි. මම එදා ක්ලාන්ත ගතියත් සමඟම හිඳ ගැනීමට තැත් කළ ගල් බැම්මේ වැදීමෙන් හිස කටුවේ සුළු පිපිරීමක් ඇති වී තිබිණි.

ඊටත් පසුව දා වන විට මට හිස කෙලින් කර ගැනීමටත්, මද වේදනාවකින් යුතුව වුවද වචන ගලපාගැනීමටත් යම්තමින් ඉඩ ලැබී තිබිණි. මට අම්මාට කතා කළ යුතු විය. සමාර් ලවා දුරකථනයට පාවිච්චි කළ හැකි කාඩ් පතක් ගෙන්වාගත් මම අම්මාට කතා කළෙමි. වේදනාව මැඩ ගනිමින් ඇයට මම යහතින් සිටින බවත්, ජංගම දුරකථනය නැතිවීම නිසා ඇමතීම ප්‍රමාද වූ බවත් පවසා එය තැබුවෙමි. මා පැවසූ බොරුව විශ්වාසවන්ත ලෙස ඇය පිළිගත් අන්දම පිළිබඳව පසුව මට දුක සිතුනද එය ඇගේ සතුට වෙනුවෙන්ම වන බැවින් ඒ ගැන මම කණගාටු නොවුනෙමි. මගේ වෙලාවටම මෙන් තාත්තා එවේලේ ගෙදර සිටියේ නැත.

මේ වන විට මම දින පහක් රෝහලේ ගත කර තිබිණි. හැම දිනයක ම අම්මාට මොහොතකට හෝ කතා කළෙමි. එහෙත්, මට දැනෙන දැඩි හුදකලාව, සැකය, බිය,.... මේ කිසිවක් තවමත් පැහැදිලි කරගත නොහැකි වී ඇත. එදා හවස ටාන්‍යාගේ මවට නැවතත් ටාන්‍යා පිළිබඳව කතාකරන්නේ යැයි මම තීරණය කරගෙන සිටියෙමි.

-කරුණාකරල මට කියනවද ටාන්‍යාට මොකද වුණේ... කියල.... ?"

ලබන කලාපයට